# වියළි කලාපයේ කෘෂිකර්මාන්තය සහ වන සත්ත්ව හානි


**ගීතානි බුලංකුලම**
**කථිකාචාරිණී**
**මානව හා සමාජ අධ්‍යයන පීඨය**
**සමාජ විද්‍යා අංශය**
රජරට විශ්ව විද්‍යාලය
මිහින්තලේ


**20 වන සියවසේ මුල් භාගයේ බිහි වූ භූගෝල විද්‍යා ග්‍රන්ථවල සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය පදනම් කරගනිමින් ශ්‍රී ලංකාව දේශගුණික කලාප තුනකට බෙදා ඇති බව ය. එනම්, අවුරුද්දේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1270 ට අඩු, ශ්‍රී ලංකාවේ වයඹ දිග මෙන්ම ගිනිකොන දිග වෙරළබඩ ප්‍රදේශ ශුෂ්ක කලාප වශයෙන් ද, මි.මී. 1270 සිට මි.මී. 1900 දක්වා වෙනස් වන දිවයිනේ හතරෙන් පංගුවක් තරම් විශාල ප්‍රදේශයක් වියළි කලාපය වශයෙන් ද, මි.මී. 1900ට වැඩි වාර්ෂික වර්ෂාපතනයක් සහිත සෙසු ප්‍රදේශ තෙත් කලාපය වශයෙන් ද හඳුන්වයි.**

මෙයට අමතරව, කාලගුණ විද්‍යාඥයන් මෙන්ම පාංශු විද්‍යාඥයන් ද මෙම දේශගුණික කලාප බෙදා වෙන්කිරීම් පිළිබඳව විවිධ ආකාරයේ නිර්ණායකයන් ඉදිරිපත් කොට තිබේ. වර්ෂ එක්දහස් නවසිය පනස් ගණන්වල අවසාන කාලයේ දී, **කැනඩාවේ හන්ටින් සර්වේ කෝපරේෂන්** නැමති ආයතනය, ශ්‍රී ලංකාවේ **වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවත්,** කෘෂිකර්ම දෙපාර්ත-මේන්තුවේ ඉඩම් පරිහරණ අංශයත් සමඟ එක් වී කළ අධ්‍යයනයක ප්‍රතිඵලයක් වශයෙන් නවතම කලාප බෙදුමක් නම් කොට **(ඉඩම් පාරිභෝගික කමිටුව - 1968)** ඇත. මෙම කලාප බෙදුම් වල දී ශුෂ්ක කලාපය සහ වියළි කලාපය වෙන වෙනම කලාප දෙකක් වශයෙන් නොව වියළි කලාපය වශයෙන් එකම කලාපයක් සේ සලකා තිබේ. ඊට අමතරව, වියළි කලාපය තෙත් කලාපයෙන් වෙන් වූ ඉම වශයෙන් සැලකූ මායිම් දෙපස බිම් තීරුවක් **අන්තර් මධ්‍ය කලාපය** වශයෙන් අළුතෙන් හඳුන්වා දී තිබේ.

වියළි කලාපයේ කෘෂිකාර්මික වගා රටාව, එය වාර්ෂික වර්ෂාපතන රටාව, භූ රූප, පස සහ ජල සම්පාදන ක්‍රමයේ ස්වභාවය ආදිය මත පදනම්ව සිදු වේ. ඊට අමතරව, වියළි කලාපයේ ජීවත් වන මිනිසුන්ගේ ආගමික චාරිත්‍ර - වාරිත්‍ර, වැඳුම් - පිදුම්, සාම්ප්‍රදායික විධික්‍රම සහ සංස්කෘතික ස්වභාවය ආදී සමාජීය ලක්ෂණ ද, ස්වභාවික සාධකයන්ට එකතුව පවතී. ඒ අනුව, කෘෂිකාර්මික කටයුතු අවුරුද්දක යල සහ මහ යන දෙකන්නය පදනම් කරගෙන සිදු කරනු ලබන අතර එය පුළුල් වශයෙන් කොටස් 04ට බෙදිය හැකිය. එනම්,

i. මාස් කන්නයේ වී ගොවිතැන
ii. යල කන්නයේ වී ගොවිතැන
iii. මාස් කන්නයේ හේන් ගොවිතැන
iv. යල කන්නයේ හේන් ගොවිතැන

ඉහත අයුරින් කෘෂිකාර්මික කටයුතුවල ගොවීන් නියැලීම සඳහා බලපාන සාධක අතර වර්ෂාපතන රටාව ඉතා වැදගත් සාධකයකි. වියළි කලාපයේ වාර්ෂික වර්ෂාපතන රටාව පිළිබඳව සලකා බලන විට එය අධික විචලතාවයකින් යුක්තය. එනම්, අඩුම වර්ෂාපතනයක් ලැබූ අවුරුද්දට පසු අවුරුද්දේ දී, ඉතාමත් වැඩි වර්ෂාපතනයක් ලැබීම ඉන් එක් ප්‍රධාන සාධකයකි. ඒ බැවි අනුරාධපුරයේ අඩුම වර්ෂාපතනය වූ මි.මී. 745.2 සහ වැඩිම වර්ෂා පතනය වූ මි.මී.2476.4 ලැබී ඇත්තේ එක ළඟම වූ 1956 සහ 1957 යන වර්ෂයන්හි දීය. දෙවන සාධකය වන්නේ ලැබිය හැකි වැඩිම වර්ෂාපතනය, ලැබිය හැකි අඩුම වර්ෂාපතනය මෙන් තුන් ගුණයක් විශාල විය හැකි වීමයි. ඒ බැවි 1956 සහ 1957 වර්ෂවල වාර්තා වූ අවම සහ උපරිම වර්ෂාපතන දත්ත නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වේ. ඊට අමතරව, අවම මෙන්ම වැඩිම වාර්ෂික වර්ෂාපතනයක් ලැබීම සිදු වන්නේ අවුරුදු 10ක් වැනි කෙටි කාලයක් තුළ වේ. **(නියඟය සහ ගොවියා, M.U.A. තෙන්නකෝන් - 1993)**

වර්ෂාපතන රටාවේ විෂමතාවයට අමතරව වර්ෂාපතනයේ සෘතුමය ස්වභාවය යන්න මත ද, වියළි කලාපීය කෘෂිකාර්මික කටයුතු නිර්ණය වේ. **නිරිත දිග මෝසම් සමය සහ ඊසාන දිග මෝසම් සමය ශ්‍රී ලංකාවේ ප්‍රධාන වර්ෂා පතන සෘතු න් ය.** වියළි කලාපයේ ප්‍රධාන වැසි සමය මාස් මෝසම් සමයයි. එය අවුරුද්දේ ඔක්තෝබර් මාසයෙන් ආරම්භ වී ඊ ළඟ වසරේ ජනවාරි මාසයේ මුල්භාගය දක්වා පවතී. ශ්‍රී ලංකාවට ඊසාන දෙසින් පිහිටි විශාල මුහුදු ප්‍රමාණයක් හරහා හමා එන සුළඟින් ඊසාන දිග මෝසම් වැසි ලැබීම නිතැනින් සිදු වෙයි. මෙහි දී රටේ නිරිත දෙසින් හමා එන වැසි වලාකුළු රටේ විශාල භූමි ප්‍රමාණයක් පසු කර වියළි කලාපය දෙසට පැමිණෙන්නේ අඩු වර්ෂාපතනයක් ඇතිවය. එබැවින්, මාර්තු මාසයේ සිට අප්‍රේල්, මැයි මාසයන් දක්වා වූ කාලය තුළ වියළි කලාපයට ලැබෙන වැසි කෙටි යල් වැසිය. මෙම ප්‍රධාන මෝසම් කාල පරිච්ඡේදයන් දෙකට අමතරව අන්තර් මෝසම් කාල පරිච්ඡේද දෙකක් ද පවතී. වියළි කලාපයේ පවතින වර්ෂා සෘතු පිළිබඳව **බී.එම්. ෆාමර්, වී. තම්බියා-පිල්ලේ** සහ **වී. ශ්‍රී රාම්** යන පරියේෂකයන්ගේ වර්ෂා සෘතු විග්‍රහ කිරීම් වලට අනුව, ඒවායේ විවිධ වෙනස්කම් දක්නට ලැබේ. **බී.එම්. ෆාමර්ගේ** සෘතු බෙදා වෙන් කිරීමට අනුව, නොවැම්බර් සිට ජනවාරි ඊසාන දිග මෝසම් කාල පරිච්ඡේදය ලෙසත්, පෙබරවාරි සිට මැයි අන්තර් මෝසම් වැසි කාල පරිච්ඡේදය ලෙසත්, මැයි සිට සැප්තැම්බර් නිරිත දිග මෝසම් කාල පරිච්ඡේදය ලෙසත්, සැප්තැම්බර් සිට ඔක්තෝබර් අන්තර් මෝසම් කාල පරිච්ඡේදය ලෙසත් හැඳින් වේ.

තව ද, වියලි කලාපයේ එක් එක් දිශානුගත ප්‍රදේශයන් සලකා බැලීමේ දී, ඒවායෙහි ද වර්ෂාපතන ව්‍යාප්තීන්ගේ පැහැදිලි වෙනස්කම් දක්නට ලැබේ. ඒ බව, වියලි කලාපයේ නැගෙනහිර ප්‍රදේශ සහ උතුරු ප්‍රදේශවල වර්ෂාපතනය ලැබීමේ කාල පරිච්ඡේදයන් සලකා බැලීමේ දී තහවුරු වේ. එනම්, වියලි කලාපයේ නැගෙනහිර ප්‍රදේශ වලට අගෝස්තු සහ සැප්තැම්බර් මාස වල දී වැඩිම වර්ෂාපතනයක් ලැබුණ ද උතුරු ප්‍රදේශයන්ට වැඩිම වර්ෂාපතනයක් ඔක්තෝබර් සහ නොවැම්බර් මාස වල දී ලැබේ. අගෝස්තු සැප්තැම්බර් මාස වල දී වියලි කලාපයේ නැගෙනහිර ප්‍රදේශ වලට ලැබෙන වර්ෂාපතනයට සාපේක්ෂව අනුරාධපුරයෙන් බටහිර දෙස ප්‍රදේශ වලට ලැබෙන වර්ෂාපතනය අඩු ය. එබැවින්, නැගෙනහිර ප්‍රදේශවල කෙරෙන කෘෂිකාර්මික කටයුතු බටහිර ප්‍රදේශ වලට සාපේක්ෂව සාර්ථක වේ. සාමාන්‍ය කරුණක් ලෙස වියලි කලාපය පිළිබඳව සලකා බැලූ විට එහි වැඩිම වැසි ලැබීම වාර්තා වන්නේ ඊසාන දිග මෝසම් සුළං සමයෙහි ය. මේ කාලයේ දී ඇති තරම් වැසි ලබා ගැනීම වියලි කලාපීය ගොවියාගේ පරම අභිලාශයයි. ඔහු සැප්තැම්බර් මාසයේ දී සුළි සුළං සහිත පූර්ව මෝසම් වැසි බලාපොරොත්තු වන අතර එම වැසි, ගොවි ජනතාව **"තිකිණි පාළ වැහි"** ලෙස හඳුන්වයි. එය නොලැබුනහොත් ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා වූ කාලයේ කොයි මොහොතේ දී හෝ ඊසාන දිග මෝසම් වැසි බලාපොරොත්තු වේ. නිරිත දිග මෝසම් සුළඟින් වියලි කලාපයට, සෙසු කලාපයන්ට සාපේක්ෂව අඩු වර්ෂාපතනයක් ලැබෙයි. නිරිත දිග මෝසම් කාල පරිච්ඡේදයෙන් අනතුරුව වියලි කලාපයට වැඩිම තෙතමන ඌනතාවයක් සහිත කාලය උදා වෙයි. එනම්, මැයි මාසයේ සිට සැප්තැම්බර් දක්වා වූ කාලයයි. මෙම කාලයේ දී ලැබෙන වැසි දුර්වල වීම හෝ කොහෙත්ම නොලැබී යාම, දැඩි උෂ්ණත්වයක් මෙන්ම (සෙන්ටිග්‍රේඩ් අංශක 31ටත් වැඩි) අවට පරිසරය තව තවත් වේලෙන උණුසුම් වියලි සුළඟ ආදී සාධක තද ඉඩෝරයක් ඇති කිරීමට ඉවහල් වේ.

වියලි කලාපීය ස්වභාවය හඳුනා ගැනීමේ දී, එකී ප්‍රදේශයේ භූ විෂමතාවය හඳුනා ගැනීම ද ඉතා වැදගත් ය. මෙය අවානක ආකාරයෙන් මධ්‍යම කඳුකරයේ සිට දිවයිනේ උතුරු මධ්‍යම වියලි කලාපය ඔස්සේ වයඹ, උතුර සහ ගිණිකොන වෙරළ දෙසට විහිදී යන මුහුදු මට්ටමේ සිට මීටර් 300කට අඩු කඳු රැන් සමූහයක් සහිත වූවකි. තරමක ගැඹුරු මිටියාවත් පද්ධතියකින් ද සමන්විත ය. විශේෂයෙන්ම, උතුරු මධ්‍යම වියලි කලාපයේ දී දිවයිනේ වයඹ, උතුරු සහ ගිනිකොන වෙරළ දෙසට දිවෙන පටු පහත් මෙන්ම ඛණ්ඩ වී ගිය කඳු රැන් වලින් වෙන් වූ නොගැඹුරු මෙන්ම පුළුල් මිටියාවත් ලෙස දැකිය හැකි අතර ඒවා සමස්ථයක් ලෙස දැකිය හැක්කේ මද රැලි බිමක් වශයෙනි. රැලි බිමේ නිම්නයන් හි පිහිටි වැව් පතුල් මෙන්ම වැව් වලට පහලින් පිහිටි කුඹුරු ද වසා පැතිර ඇත්තේ සියම් **"ඇලුවියල්"** පස ය **(මුවරිමන් සහ පානබොක්කේ -1961)** මෙම පස තද සියුම් කිරිමැටි පසෙහි පටන් රළු වැලි සහිත පස දක්වා වූ පාංශු සංයෝගයන්ගෙන් යුක්තය. වැව් පතුල් වලත්, වැවට පහලින් ආසන්නව පිහිටි කුඹුරු වලත්, විශේෂයෙන් පුරාණ වෙල් වශයෙන් හැඳින්වෙන කුඹුරුවලත්, බහුලවම කිරි මැටි පස දැකිය හැකි අතර රළු වැලි සහිත පස වැව් වලට ඈතින් සහ උස් බිම්වල බෑවුම් ආශ්‍රිතව දැකිය හැකිය. උතුරු - මධ්‍යම වියලි කලාපයේ භූමියෙන් විශාලතම කොටසක දක්නට ඇත්තේ රතු පැහැති ගුරු පසයි.

ඉහත සඳහන් වියලි කලාපීය ස්වභාවික සාධකයන්ට අනුකූලව තම කෘෂිකාර්මික කටයුතු සිදු කර ගැනීමට ගොවියා පුරුදුව සිටී. වැඩිම වර්ෂාපතනයක් ලැබෙන මාස් කන්නයේ දී (ඔක්තෝබර් - ජනවාරි) කුඹුරු ඉඩම්වල වී ගොවිතැන මෙන්ම ගොඩ ඉඩම්වල හේන් ගොවිතැන ඉතා සාර්ථකව සිදු කරයි. වියලි කලාපීය ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන ගොවිතැන සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය වර්ෂාව නිසිකලට, වේලාවට ප්‍රමාණවත් පරිදි ලබාදෙන ලෙස කන්නය ආරම්භ වීමට මත්තෙන් පුරාණ ගම්වල දෙවියන්ට නොයෙකුත් පුද පූජා විධික්‍රම පවත්වා කන්නලව් කෙරේ. **"මුට්ටි නැමුම් මංගල්‍යය"** මෙසේ දෙවියන්ට යාඥා කරන එක් විධි ක්‍රමයකි. ඉන් අනතුරුව තම වැව් වාන් දමන තුරු වැසි ලැබේ යැයි යන බලාපොරොත්තුව මත පසුවන ගොවියාට ඊසාන දිග මෝසම් වැසි බොහෝ විට නොඅඩුව ලැබෙයි.

අනතුරුව, කන්න රැස්වීම් පවත්වා ගොවීන් තම කුඹුරු ඉඩම්වල මහ වී වර්ගයක් (හාර මාස් වී) හෝ බාල වී වර්ගයක් (තුන් මාස් වී) යෙදීමට තීරණය කරයි. වියලි කලාපීය කුඹුරු ගොවිතැනේ දී බරපතල ලෙස අලින්ගෙන් වගා හානි සිදු විය හැකිය. වියලි කලාපයේ කුඹුරු, විශාල යායවල් ලෙස පවතින හෙයින් බොහෝමයකට හානි සිදු නොවුනත් වනාන්තරයකට හෝ කැලෑ රොදකට මායිම්ව පිහිටි කුඹුරු සඳහා හානි සිදු වන නිසා ඒවා අලින්ගෙන් ආරක්ෂා කර ගැනීමට සිදු වේ. මීට අමතරව, හේන් ගොවිතැන ද ප්‍රධාන වන අතර මහ කන්නයේ කුඹුරු වපුරා අවසන් කිරීමත් සමඟ තිකිනි කාලයේ දී කැලෑ සුද්ද පවිත්‍ර කොට හේන් ගොවිතැන සඳහා සකසන ලද **"නවදැලි"** බිම්වල කුරහන්, බඩඉරිඟු, මෙනේරි, අබ, රටකජු, මිරිස්, මුං, කව්පි, උඳු, වට්ටක්කා, බණ්ඩක්කා, පිපිඤ්ඤා, වැටකොළු, වම්බටු, මැකරල් ආදී එළවළු වර්ග වගා කෙරෙයි. මේ එක් එක් බෝගයන්ට සුදුසු පස, එහි ස්වභාවය, ජල සම්පාදනය ආදිය පිළිබඳව ගොවියාට පුරුද්දට මෙන් ඉවක් පවතී. තම වගාවන් සඳහා තෝරාගත් පස, වැලි සහිත පසක් නම් එහි විශේෂයෙන් රටකජු වැනි බෝග වගා කිරීමටත්, රතු දුඹුරු පසක් ඇති විට සෙසු ධාන්‍යය බෝග ඇතුළු පහත රට එළවළු වර්ග වගා කිරීමටත් කටයුතු සිදු කෙරෙයි. පුරාණ කාලයේ සිටම ගොවීන්ට තම හේන හෝ කුඹුර පිහිටි ස්ථානය අනුව ඒවාට පවතින වන සත්ත්ව හානි පිළිබඳව ද අවබෝධයක් තිබුණි. එනම්, අසවල් හේනට හෝ කුඹුරට වැඩි වශයෙන්ම හානි සිදුවිය හැක්කේ කුමන සත්ත්ව කණ්ඩායම් වලින් ද යන්න පිළිබඳව ය. එබැවින්, ඔවුහු විශේෂයෙන්ම හේන් ගොවිතැනට සිදු වන වන සත්ත්ව හානි අවම කර ගැනීම

පිණිස කැලය මධ්‍යයේ සිටුවන ලද කණුවක සිට වෘත්තාකාරව වීහි දී යන ලෙස හේන් යායවල් පවත්වාගෙන යාමට කටයුතු කළහ. මෙවැනි ආකාරයෙන් සකස් කරන ලද හේන් **මුල්කැටා ක්‍රමයට සකසන ලද හේන** වශයෙන් පුරාණ ගොවියෝ හැඳින්වූහ. **මුල් කැටා** හේනක දී එය අයිති එක් ගොවියෙකුට වන සත්ත්ව හානි වලින් ආරක්ෂා කර ගැනීමට හිමි වන්නේ වෘත්තයක පරිධියට පිහිටි එක් වනාතකි. මෙවැනි ක්‍රමයක් යටතේ සාමූහිකව ගොවිතැන් කිරීම, වන සත්ත්ව හානි වළක්වා ගැනීමට ගොවීන් යොදා ගත් එක් පහසු ක්‍රමයකි. තනිව හෝ සාමූහිකව එක් දිශාවකට මුහුණලා **හතරැස් පංගු ක්‍රමයට** හේන් සකස් කිරීමේ දී වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා හේනක වනාත් කිහිපයක් තිබිය හැකි අතර එය ආරක්ෂා කර ගැනීම දුෂ්කර කාර්යයකි. කෙසේ වුවද වගාවන් සඳහා ඇති වන වන සත්ත්ව හානි අවම කරගත හැකි වුව ද ඒවා සම්පූර්ණයෙන්ම ඉවත් කර ගැනීමට නොහැකිය. වන සතුන්ගෙන් තම වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා තම හේනේ හෝ කුඹුරේ එක් මධ්‍යය ස්ථානයක් තෝරා ගෙන පැළක් තනාගෙන රාත්‍රී කාලයේදීත් දිවා කාලයේදීත් එහි වාසය කරනු ලබයි.

වියලි කලාපීය හේන් ගොවිතැන් වල දී වඩාත්ම වන සත්ත්ව හානි පමුණුවන වගාවන් වන්නේ බඩඉරිඟු, වට්ටක්කා, කුරක්කන් වැනි බෝගයන් ය. එනම්, මෙවැනි බෝගවල බීජ සිටුවීමේ දී මීයන්, රිලවුන් වැනි සතුන්ගෙන් ආරක්ෂා කර ගත යුතු වේ. මෙවැනි සතුන්ට බීජ වර්ග සිට වූ ස්ථාන සොයාගත හැකි වුවහොත් ඇතිවන හානිය අති විශාලය. මාස් කන්නයේ දිනපතා වැසි බලාපොරොත්තු විය හැකි බැවින් බීජ වර්ග සිටුවීමෙන් අනතුරුව එම ස්ථාන මැකී යන තරමට වතුර ගලා යන තෙක් වර්ෂාව ලැබේ. එය ගොවීන්ට මහත් අස්වැසිල්ලකි. බෝග පැළ අවධියේදී මුවන්, හාවුන්, ඉබ්බන් වැනි සතුන්ගෙන් හානි සිදු වේ. එනම් මෙම සත්තු මෙවැනි ළපටි පැල වර්ගවල දළු, කොළ අනුභව කරති. මෙය විශේෂයෙන්ම, රාත්‍රී සහ අළුයම් කාලයේ දී සිදු වන බැවින් ඒ සඳහා ගොවීහු රෑට පැල් රකිති. බෝගවල එලදාව හටගන්නා කාලයේ දී, රිලවුන්, වඳුරන්, ඌරන් මෙන්ම ගිරවුන් වැනි පක්ෂීන්ගෙන් ද එලදාවට විශාල හානි සිදු වේ. එම කාල පරිච්ජේදය තුළ දී, දිවා රෑ වෙහෙස නොබලා ගොවීන්ට පැල් ලැගීමට සිදු වේ. තම හේනේ එලදාව තමන් අනුභව කිරීමට මත්තෙන් ගොවීන් තම එලදාව **පුල්ලෙයාර් දෙවියන්ට පිදීම** සිරිතක් ලෙස පිළිගෙන තිබේ. එසේ නොකළහොත් වගාවට, වන සතුන්ගෙන් ඇතිවන හානිය වැඩිවන බවට ගොවීන් අතර මතයක් පවතී. විශේෂයෙන් බඩඉරිඟු වැනි බෝගයක එලදාව, ගෘහස්ත පාරිභෝජනයට ප්‍රථම පුල්ලෙයාර දෙවියන්ට පුදති. එසේම, යල් කන්නයේ දී හේන්වල වගා කරන තල වැනි බෝගයන්ගේ එලදාව ලබා ගැනීමෙන් අනතුරුව ද ප්‍රථමයෙන්ම තල ගුලි වැනි කැවිලි වර්ගයක් සාදා **පුල්ලෙයාර්** දෙවියන් පුදති. යල් කන්නයේ දී වගා කරනු ලබන තල වැනි බෝගයන් සඳහා වන සතුන්ගෙන් හානියක් සිදු නොවන තරම් ය.

කෙසේ වුවත්, ගොවීන් තම වගාවන්, වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා හේනට හෝ කුඹුරට උචිත ආකාරයෙන් ගස උඩ පැලක්, බිම් පැලක් හෝ කණු පිට පැලක් සාදා රෑ එළිවෙන තුරු, තම වගාව, වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට දුක් ගැහැට විඳින අතර කාන්සිය, මහන්සිය මෙන්ම පාළුව මගහරවා ගැනීමට ඕසෙට යාය සිසාරා යනතෙක් කව්පද වැල් ගොතන්නට පුරාණ කාලයේ සිටම පුරුදුව සිටියහ.

ඉරුං තලප දඩමස් හොද්දෙන් කන්නේ
පැළට ඇවිත් ගෝහාලෙන් බුදින්නේ
එන එන සතුන් ගැහැ කියලයි පන්නන්නේ
හේනට විඳින දුක මා පමණයි දන්නේ


## ගොවි ජනතා

**"ගොවි ජනතා"** සඟරාවේ පසුගිය කලාප කිහිපයක සීමිත පිටපත් සංඛ්‍යාවක් ඉතිරිව තිබේ. දැනට මෙම කලාපයන් **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ** ප්‍රකාශන අලෙවි කවුළුවෙන් මිල දී ගැනීමේ හැකියාව පවතී.

එමෙන්ම, අවශ්‍ය කලාප සංඛ්‍යාව සඳහන් කොට, අදාළ ගෙවීම මුදල් ඇනවුමකින් ආයතනය වෙත ලැබෙන්නට සැලැස්වීමෙන් අවශ්‍ය පිටපත් ප්‍රමාණය ලබාගත හැකිය.

| **කලාපය** | **තේමාව** | **මිල** |
|---|---|---|
| 2003 ජනවාරි - අප්‍රියෙල් | ජල කළමනාකරණය | රු.20.00 |
| 2003 මැයි - ඔක්තෝබර් | ගොවි ණය | රු.20.00 |
| 2004 ජනවාරි - ඔක්තෝබර් | සත්ත්ව පාලනය | රු.20.00 |
| 2004 නොවැම්බර් - දෙසැම්බර් | සංවර්ධන සන්නිවේදනය | රු.20.00 |

සියළු මුදල් ඇනවුම්

**අධ්‍යක්ෂ**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,**

**114, විජේරාම මාවත,**

**කොළඹ - 07.**

***දුරකථන : 2696981, 2698540 - 41***